ඇමුණුම 01

**<u>දිවයිනේ ජාතික පාසල්වල විදේශ භාෂා ඉගැන්වීමට ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 – I (අ) ශ්‍රේණියට උපාධිධාරීන් බඳවා ගැනීම 2021(2023)</u>**

ඉහත බඳවා ගැනීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ 2024.01.03 ප්‍රදර්ශනය කරන ලද කරන ලද පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් සඳහා පත්වීම් ලබා දීමේ උත්සවය ගරු අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාගේ සහ ගරු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය ඒ. අරවින්ද් කුමාර් මැතිතුමාගේ සහභාගීත්වයෙන් 2024.02.01 දින පෙ.ව. 8.30 ට අධ්‍යාපන අමාත්‍යාංශයේ 7 වෙනි මහල් ශ්‍රවණාගාරයේ දී පැවැත්වීමට නියමිතය.

02.ඒ සඳහා 2024.02.01 දින පෙ.ව. 7.30 වන විට පිරිමි පත්වීම්ලාභීන් කළු කලිසම, සුදු කමිසය සැරසී පැමිණිය යුතු අතර කාන්තා පත්වීම්ලාභීන් ලා පැහැයෙන් යුතු සාරියකින් හෝ ඔසරියකින් සැරසී පැමිණිය යුතුය.

03.මෙම උත්සවය සඳහා පත්වීම්ලාභීන් පමණක් සහභාගී විය යුතු අතර වෙනත් කිසිදු පුද්ගලයෙකු උත්සව ශාලාව වෙත රැගෙන යාමට අවසර දෙනු නොලැබේ.

04. මේ සඳහා ගමන් වියදම් හෝ වෙනත් දීමනා කිසිවක් ගෙවනු නොලැබේ.

05.මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් තොරතුරු දැන ගැනීමට අවශ්‍ය නම් 0112784843 යන දුරකථන අංකය අමතන ලෙස මෙයින් කරුණිකව දන්වමි.